ඔබ බිය විය යුතු නැත

ලියුකේමියා රෝගය සහ මව් සෛල ප්‍රදානය

වෛද්‍ය පද්මා හේරත් විසිනි

කාට හරි ලියුකේමියාව කියූ සැණින්ම අපේ මිනිසා නැගෙන්නේ කැක්කුමයි. මොකද, අපි කව්රුත් දන්නවා ඒක මාරාන්තික රෝගයක් කියලා. ලියුකේමියාව කියන්නේ ලේ පිළිකාවක්. මේ පිළිකාව හඳුනාගිය, අපේ මිනුවන වල ති යන සුදු රුධිරානු හඳන මව් සෛල (Stem Cells) වල වෙනසක් ඇති වෙලා උවමනාවට වඩා වේගයෙන් බෙදිලා අවශ්‍ය ගණනට වඩා සෛලය සංඛ්‍යාවක් හදනවා. සම්මත වර්ගයේ ලියුකේමියා වලදී, මව් සෛල වලින් අවශ්‍ය ප්‍රමාණයට සුදු රුධිරානු හැදෙන්නේ නැහැ. අපි දන්නවා, රුධිරයේ තියන සුදු රුධිරානු වලින් තමයි ශරීරයට ඇතුළු වන විෂබීජ විනාශ කරලා ඇණ ලෙඩ රෝග හැදෙන එකෙන් බේරා ගන්නෙ. නමුත් ලියුකේමියා රෝගයේදී අර කලින් කිව්ව විදිහට සුදු රුධිරානු වැඩිපුර හැදුනට, ඒවායේ රෝග විනාශ කරන හැකියාවක් නැහැ. ඒ නිසා සුදු රුධිරානු කොයි තරම් විශාල ප්‍රමාණයක් තිබුණත් ඒවායින් පළක් නැහැ. ඉතින් ඒ රෝගියා සාමාන්‍ය විශබීජ වලට ගොදුරු වුණොත් ඉක්මණින් ඒක අසාධ්‍ය තත්වයට පත් වෙලා මිය යනවා. එහෙම නැතිනම්, සුදු රුධිරානු වැඩි කමට රුධිරයේ ඝණත්වය වැඩි වෙලා නහර තුල රුධිරය කැවී ගැහෙනවා. එහෙමත් නැතිනම්, ඇඟ තුල විශාල ලේ ගැස්මී ඇති වෙලා මිය යනවා. පිටින් ලේ දුන්නට මේ රෝගය මැඩ පවත්වන්න බැහැ. මොකද, අපි මිනුවන වල මේ පිළිකා තත්වය වෙනස් වෙලා නැහැ. ලියු කේමියා රෝගය, කුඩා ළමයාගේ සිට මහල්ලා දක්වා ඕනම කෙනෙකුට හැදෙන්න පුළුවන්.

දැන් අපි බලමු, ප්‍රතිකාර ක්‍රම මොනවාද කියලා. පළමුව කරන්නෙ, අර රුධිරයේ හා ඇට මිනුවන වල තියන පිළිකා සෛල ඛෙහෙත් වර්ග වලින් විනාශ කරනවා (chemotherapy). ඉතාමත් සැර ඛෙහෙත් වර්ග කිහිපයක් රුධි රයට කොලින්න සේලයින් සමඟ දෙනවා. දිනපතා, සතිපතා, සම්හර ඛෙහෙත් වර්ග මාස කිහිපයක් තිස්සේ දෙන්න වෙනවා. මේ වායේ අතුරු විපාක විශාල වශයෙන් දකින්න ලැබෙනවා. කොණ්ඩෙ යනවා, හම වෙනස් වෙනවා, විශාල වශයෙන් වමනය, කෑම අරුචිය ඇති වෙනවා. සම්මත අයගේ සුදු රුධිරානු අන්තිම අඩුවට බහිනවා. එතනදි ලේ ගැලීම් නැත්නම් නොයෙකුත් ආසාදන වලට ගොදුරු වෙන්න පුළුවන්. සම්හර අය මේ අතරතුර ආසාදන වලට ගොදුරු වීමෙන් මිය යන්නත් පුළුවන්. Chemotherapy ඉරව වුනහම, ශරීරය කිරණ වලට අල්ලනවා (radiotherapy) මෙතනදි බලාපොරොත්තු වෙන්නේ, බැරි වෙලා හරි ඉතුරු වෙලා තියන පිළිකා සෛල ඇට මිනුවන වල තියනවානම් ඒ ටිකත් සම්පූර්ණයෙන්ම විනාශ කිරීමයි. මොලය සහ මධ්‍යම ස්නායු පද්ධතියත් මේ කිරණ වලට භාජනය කරන්නේ, සියළුම පිළිකා සෛල විනාශ කරන්නයි. මේක තමයි සාමාන්‍ය ප්‍රතිකාර ක්‍රමය. ඊට පස්සෙ රෝගියාගේ ඇට මිනුවන වලින් සාමාන්‍ය සෛල සෑදෙනකොට, ප්‍රතිකාර ක්‍රමය නවත්වනවා. මේකට remission කියලා කියනවා.

නමුත්, සම්හර අය ටික කාලයක් ගියහම නැවත පිළි කා සෛලා හැදෙන්න පටන් අරගෙන අර පෙර කියූ තත්වයට පත් වෙනවා. නැවත නැවතත් බෙහෙත් සහ කිරණ වර්ග ලබා දීම ශරීරයට දුරන්න අමාරුයි. මෑතක් වෙනකමම මේ ප්‍රතිකාර ක්‍රමය තමයි රෝහල් වල කෙරෙනෙ. ඉතින් හුඟක් රෝගීන් මේ අතරතුර මිය යනවා.

මීට අවුරුදු ගණනකට කලින්, හිරෝගී මව් සෛල බද්ධ කිරීම පටන් ගත්තා. මේක තමයි ලියුකේමියා රෝගයට ස්ථිර ප්‍රතිකාරයක් වශයෙන් හඳුනාගෙන තියෙන්නෙ. මෙතෙන්දි, chemotherapy, radiotherapy වලින් අර රෝගියාගේ සි යළුම පිළිකා සෛල විනාශ කළාට පස්සෙ, රෝගියාගේ සෛල පටක වලට ගැලපෙන නිරෝගී කෙනෙකුගේ මව් රුධිර සෛල ටිකක් රෝගියාගේ ඇඟට ඇතුළු කරනවා. ඒ නිරෝගී සෛල ඇට මිනුවන වල වර්ධනය වෙලා ශරීරය නිරෝගී තත්වයට පත් වෙනවා. මෙතනදී, මේ මව් සෛල ටිකයි රෝගියාට අවශ්‍ය වෙන්නේ.

මෙතනදි නැගෙන ලොකුම ගැටළුව තමයි, රෝගියාගේ ඇඟට ගැලපෙන මව් සෛල කොයා ගැනීම. තමන්ගෙම සහෝදරයෙකුගෙන් හෝ සහෝදරියකගෙන් නම්, 3 කට 1 අනුපාතයට මෙම ගැලපීම මං සොයා ගැනීමට හැකියාවක් ති යනවා. මෙලෙස ගැලපෙන දායකයෙක් සොයා ගැනීමට බැරි වුනොත්, වෙනත් ශ්‍රී ලාංකික සමිතියක් ඇති කෙනෙකුගේ පි හිට පැතිමට සිදු වෙනවා. පවුලෙන් පිටස්තර වෙනත් ශ්‍රී ලාංකිකයින් අතරින් රෝගියාට ගැලපෙන දායකයෙක් සොයා ගැනීමට ඇති හැකියාව, 1,000 කට 1 ක් පමණ ඉතා සුළු අවස්ථාවක් පමණයි. ඒ කියන්නේ, ශ්‍රී ලාංකි ක ලියුකේමියා රෝගියෙකුට නම්, ලාංකීය සමිතියකින් ඇති දායකයින් 1,000 ක් අතරී න් එක් අයෙකු ගෙන් පමණයි මේ සෛල පටක ගැලපුම හරි යන්නේ.

ඔස්ට්‍රේලියානු ඇට මිනුවන් දායක ලේඛණයේ (Australian Bone Marrow Donor Register) ලියාපදිංචි දායකයින් 160,000 අතර ඉන්නේ, ශ්‍රී ලාංකික දායකයින් 400 කට අඩු ප්‍රමාණයක්. ලංකාවේ එහෙම ලේඛණයක් ඇත්තෙත් නැහැ. ඉතින් ඔස්ට්‍රේලියාව වගේ දියුණු රට වල ඉන්න අපි වගේ අයට පමණයි, මෙවැනි දායක ලේඛණයකට නම අතැතුල් කරන්න පුළුවන්. ශ්‍රී ලංකාවේ හෝ ලෝකයේ වෙනත් ඕනෑම රටක පීවත් වන ශ්‍රී ලාංකික සමිතිවයක් ඇති ලියුකේමියා රෝගියෙකුට, මෙම ඔස්ට්‍රේලියානු දායක ලැයිස්තුවේ ලියාපදිංචි ශ්‍රී ලාංකික දායකයින් අතරින් සෛල පටක ගැලපුම්ක් තිබේදැයි සොයා බලන්නට, පහසුවෙන් පුළුවන්.

හුඟක් අය බයයි මව් සෛල ප්‍රදානයට, විශේෂයෙන් මේක වේදනාකාරී එකක් වෙයි කියලා. මේක ඒ තරම් වේදනාකාරී නැහැ. අනික තව කෙනෙක්ගේ ජීවිතය බේරා ගැනීම ඉතා ටිකක් හිතලා බැලුවම, සාමාන්‍ය වේදනාවක් වුනත් උසුලා ගැනීමට ශ්‍රී ලාංකික අපිට එතරම් අමාරු නැහැ. අනික, දායක ලේඛණයට තමන්ගේ නම දානවා කියන්නේ අභිවාරය යෙන්ම මව් සෛල ප්‍රදානය කරනවාම නොවේ.

මව් සෛල දායකයෙක් හැරවීයට දායක ලැයිස්තුවේ ලියාපදිංචි වීමට නම්, වයස අවුරුදු 18 ට වැඩි සහ 50 ට අඩු, ඔස්ට්‍රේලියානු ස්ථිර පදිංචි භාවය ඇති කෙනෙක් වෙන්න ඕන. මේ අයට වෙනත් පිළිකා රෝගයක් හෝ හෘදයාබාධ වැළඳී තියෙන්න බැහැ. නමුත්, අධික රුධිර පීඩනයට බෙහෙත් ගන්න, දියැ වැඩියාව පාලනය කළ සහ කොලෙස්ටෙරෝල් තියන අයට පවා මෙහි ලියාපදිංචි වෙන්න පුළුවන්. මෙසේ ලියාපදිංචි වන දායකයින්, වයස අවුරුදු 55 පසු වන තුරු දායක ලැයිස්තුවේ තියා ගන්නවා.

දැන් අපි බලමු, කොහොමද මේ මව් සෛල ප්‍රදානය කරෙන්නෙ කියලා. ක්‍රම දෙකකින් මව් සෛල ලබා ගන්නවා. දැන් දැන් වැඩිපුරම භාවිතා වන ක්‍රමය, රුධිරයෙන් මව් සෛල ලබා ගන්න එක. මෙතනදී, ප්‍රදානය කරන දායකයාට දිනකට වතාවක් ඉන්ජෙක්ෂන් කිහිපයක් දෙනවා. එව්ට දායකයාගේ අඟේ ඇට මිනු ළු වල වැඩිපුර මව් සෛල ගණනක් ඇති වෙලා ඒක රුධිරයට එකතු කරනවා. ඉතින් සාමාන්‍ය විදියට රුධිරය එකතු කර මේ මව් සෛල වෙන් කර ඒවා රෝගියාට ප්‍රදානය කරනවා. රෝගියාගේ අවශ්‍යතාවය අනුව කලාතුරුකින් භාවිතා වන අනිත් ක්‍රමය නම්, උකුල් ඇටයට ඉඳිකටුවක් ඇතුල් කරලා ඇට මිනුළු ටිකක් ගැනීමයි. මෙතනදි වේදනාවක් ඇති වෙන්නෙ නැහැ, මොකද සම්පූර්ණයෙන්ම නිර්වින්දනය කරලයි (anaesthesia) ඒ ඇට මිනුළු ගන්නෙ. පසුව දවස් 2 ක් 3 ක් යනකම් සාමාන්‍ය තරමක අපහසුවක් ඇට මිනුළු වල ඇති වෙන්න පුළුවන්.

ලේ බැංකුවේ වෛද්‍යවරු, මව් සෛල ප්‍රදානය කරන තැනැත්තාගේ ශරීර සෞඛ්‍යය ගැන දිගටම විමසිලිමත් වෙනවා. එම නිසා පසුව තමන්ට ප්‍රශ්නයක් ඇත්නම්, ඒ අයට කතා කර වෛද්‍ය පරීක්ෂණ කරවා ගත හැකියි.

ඔස්ට්‍රේලියානු ඇට මිනුළු දායක ලේඛණයේ ලියා පදිංචි දායකයින් අතරීන්, ශ්‍රී ලාංකික සහ විදේශීනාම් පාරිකයින් නියෝජනය වන්නේ ජනගහණ අනුපාතයට අනුව ඉතා අඩු සංඛ්‍යාවක් බවට හඳුනාගෙන තියනවා. මෙම ජන කොටස් දෙකට අයත් මව් සෛල දායකයන් වැඩි වැඩියෙන් ඔස්ට්‍රේලියානු ඇට මිනුළු දායක ලේඛණයේ ලියා පදිංචි කරවීමේ මහා වැඩ පිළිවෙලක්, ඇට මිනුළු දායක ආයතනය (Bone Marrow Donor Institute - BMDI) මඟින් දියත් කරලා. විස්ටෝරියානු රජය මෙයට මුදල් ආධාර සපයනවා. එම ආයතනයේ ඉල්ලීම පරිදි, ශ්‍රී ලාංකික සංවිධාන, ආදි ශිෂ්‍ය සංගම්, පන්සල්, පුද්ගලයින් මෙන්ම ලියුකේමියා රෝගීන්ගේ දෙමාපියන්දු එකට එක් වී , මෙම ශ්‍රී ලාංකික පීවිත බේරා ගැනීමේ වැඩ පිළිවෙලට උරදෙනවා. මේ සැමගේ සාමූහික උත්සාහයෙන්, මේ වසර දෙකේදී ශ්‍රී ලාංකික මව් සෛල දායකයින් 260 දෙනෙක් ඇළුතින් ලියාපදිංචි කරවා තියෙනවා. මෙම වැඩ පිළිවෙලේ ඉලක්කය වන්නේ, ශ්‍රී ලාංකික දායක සංඛ්‍යාව 1,000 ක් දක්වා වැඩි කිරීමෙන්, එක් ශ්‍රී ලාංකික ලියුකේමියා රෝගියකුගේ හෝ පීවිතය ගලවා ගැනීමයි.

බේරා ගැනීමට හැකියාව තිබෙද්දී නිරපරාධේ අකාලයේ නැති වී යන ශ්‍රී ලාංකික පීවිත බේරා ගැනීමට නම්, ඔබ සැමගේ ඉදි රි පත් වීම ඉතා හදිසි අවශ්‍යතාවයක්. වයස හෝ සෞඛ්‍ය හේතුන් මත ඔබට මව් සෛල දායකයෙක් ලෙස ලියාපදිංචි වී මට හැකියාවක් නොමැති නම්, ඔබගේ පවුලේ අය සහ හිත මිතුරන් මේ සඳහා ලියාපදිංචි කරවීමෙන් ඔබට දායක වෙන්න පුළුවන්. ඔබ සම්බන්ධ වී සිටින ශ්‍රී ලාංකික සංගමය හෝ ආගමික ආයතනය හෝ විශේෂ විද්‍යාලය හෝ වෙනත් ඕනෑම කණ්ඩායමක් මඟින්, මව් සෛල දායකයින් ලියා පදිංචි කරවීමේ සැසියක් සංවිධානය කරන්න පහසුවෙන් පුළුවන්. ඒ සඳහා, දු රකවන 9342 7888 මඟින් BMDI අමතන්න. ඔබගේ ප්‍රදේශයේ පාසැල් හෝ ප්‍රජා ශාලාවක් මේ සඳහා නොමිලේම ලබා ගන්න පුළුවන්. ලේ බැංකුවේ විශේෂඥ හෙදියන් එහි පැමිණ, සතියේ දිනක සවස හෝ ඉරිදා දිනක වුවද, දිනකදී 20 සිට 50 දක්වා දායක සංඛ්‍යාවක් ලියා පදිංචි කරනවා ඇති. වරකට 3 හෝ 4 දෙනෙක් බැගින් ගෙන මව් සෛල ප්‍රදානය ගැන තොරතුරු කියා දී, අවශ්‍ය ඉල්ලුම් පත්‍ර පුරවා අත්සන් කරවා ගෙන, සුළු රුධිර සාම්පලයක් ලබා ගැනීමෙන්, විනාඩි 15 ක පමණ කාලයක් ඇතැලත ලියාපදිංචිය සම්පූර්ණ කෙරෙනවා. ලියාපදිංචි වීමට කැමති අයගේ නම් සහ දුරකථන අංක කලින් ලබාගෙන, වරකට 3 හෝ 4 දෙනා බැගින් විනාඩි 15 ක කාල සීමාවක් වෙන් කර දීමෙන් මෙය සාර්ථකව කර ගත හැකියි. මේ පිළිබඳ වැඩි විස්තර දැන ගැනීමට, BMDI වෙබ් අඩවියට පිවිසෙන්න (www.bmdi.org.au) අවශ්‍ය තාවය ඉතා හදිසියි, ඒ නිසා අදම ක්‍රියාත්මකවන්න! මව් සෛල/ඇට මිනුළු දායකයෙක් ලෙස අදම ලියා පදිංචි වන්න !!!

රූපිකා
ඇට මුළු දායක ආයතනයේ 250 වෙනි දායිකාව

පසුගිය සැප්තැම්බර මස 11 වෙනි ඉරිදා දුකුණු ඕස්ට්‍රේලියානු ප්‍රාථමික පාසැල් ශාලාවේදී පවත්වනු ලැබූ ඇට මිදුළු/රැධිර මව් සෛල දායක ලියා පදිංචිකෙරීමේ ශ්‍රී ලාංකික ඇට මිදුළු දායක වැනපතිරාජ් 250 වෙනි දායිකාව වූ රූපිකා ද කිළිවා වෙත ඇට මිදුළු දායක ආයතනය (Bone Marrow Donor Institute) මඟින් පිරිනැමිය ලද විශේෂ සහතිකය සහ පිළිනය ප්‍රදානය කරන ලද්දාද, රතු කුරුස ලේ බැංකුවේ ඇට මිදුළු විශේෂඥ ශාදි පෙනී රොමිලේ විසිනි. මෙම දායක ලියා පදිංචිය සංවිධානය කලේ, විස්ටෝරියානු ආදි ආනන්දීය සංගමය, ජර්මන් කාර්මික අඥාන ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමය සමඟ තවත් පුද්ගලයින් සහ පන්සල් කිහිපයක් කම සහභාගිත්වයෙනි. ශ්‍රී ලාංකික ජීවිත බේරා ගැනීමේ අරමුණින් ඳිලිග ඇට මිදුළු/රැධිර මව් සෛල දායකයින් ලෙස ලියා පදිංචි වූ සැමට, ශ්‍රී ලාංකික ප්‍රජාව වෙනුවෙන්, එම සංවිධායකයින්ගේ ස්තූතිය පිරිනැමේ. විස්ටෝරියානු රජයේ අනුග්‍රහයෙන්, ඇට මිදුළු දායක ආයතනය මඟින් දියත් කරන ලද මෙම වෛද්‍යපතිරාජ් ගුලක්කය වන ශ්‍රී ලාංකික ඇට මිදුළු දායකයින් 1,000 ක් ඔස්ට්‍රේලියානු ඇට මිදුළු දායක ලේඛනයට ඇතුළත් කර ගැනීමේ මහතු කාර්යභාරය, ඔබත් ඉක්මණින්ම දායක වන ලෙස අපි ආයාචනා කර සිටමු .

Casey Spices Plus
Tel: 5995-3035 Fax: 5995-0510
15 Cranbourne Place
CRANBOURNE, VIC 3977
MELWAY: 133 J2
Grocery Store
සහල්
ධාන්‍ය වර්ග
පිටි වර්ග
අසුරණ ලද කෑම වර්ග
අධි ශීත කළ/විපලනය කළ එළවළු
අධි ශීත කළ මාළු
සිසිල් බීම
රස කැවිලි
ටෙලිෆෝන් කාඩ්
DVD හා CD
වීඩියෝ
සකස් කළ කෑම
සියලුම උත්සව සඳහා ආහාර පාන සැපයීම
WE ARE HERE!
PLACE
CRANBOURNE
CHILDREN'S PARK
CAR PARK
WHITE PARK
STH BUFFALLO VIST
CAMMS RD
එදිනෙදා ගෙදරට අවශ්‍යවන සෑම දේ
අපෙන් ලබා ගන්න
Casey Spices Plus